**යාපනය විශ්වවිද්‍යාලය - 2013**

**--------------------------------**

යාපනය විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107 (5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ. මෙම වාර්තාව විශ්ව විද්‍යාල පනතේ 108 (2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාව ලෙසද සැලකිය යුතුය.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට යාපනය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති ( ශ්‍රී ලං රා ගි ප්‍ර )

සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද හා සමාලෝචිත වර්ෂයේ අඛණ්ඩව භාවිතා කරන ලද රු.6,836,000 ක් වටිනා උපාධි ලෝගු සහ පදක්කම් ආදී ස්ථාවර වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති - 3 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය කෙරෙමින් පවතින බවත්, ප්‍රධාන වශයෙන් ඉඩම් හා ගොඩනැගිලි, අර්ධ ස්ථිර ව්‍යුහයන්, මෝටර් වාහන හා උපාධි ලෝගු පිළිබඳ තක්සේරු කිරීමේ වැඩවලින් සියයට 80 ක් නිම කර ඇති බවත් මේ සම්බන්ධයෙන් උපකුලපතිවරයා දන්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2005 සිට 2009 දක්වා වර්ෂවලට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.1,845,672 ක් වටිනා පොත් හා වාරසඟරා සහ රු.1,359,072 ක් වටිනා පුවත් සඟරා හා වාරසඟරා විෂයයන් 87 ක් 2014 සැප්තැම්බර් 30 දින වන විටත් සැපයුම්කරුවන්ගෙන් ලැබී නොතිබුණි. කෙසේ වුවද මෙම පොත් හා වාරසඟරා සඳහා රු.438,214 ක් වූ ක්ෂය සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව අයකර තිබුණි.

(ආ) වටිනාකම පිළිවෙලින් රු. 41,045,741 ක් හා රු.50,000,000 ක් වූ ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ හා අභ්‍යන්තර මාර්ග වැඩ උතුරු පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හා මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂය තුළදී නිමකර විශ්වවිද්‍යාලයට භාර දී තිබුණි. කෙසේවුවද ඒවා ප්‍රාග්ධනිත කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව 2012 වර්ෂයේ සිට අවිනිශ්චිත ගිණුමේ රු.364,569 ක ශේෂයක් දක්වා තිබුණි.

#### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ පහකට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවති රු.146,703 ක හිඟ ශේෂයන් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) වර්ෂ 6 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවති හිඟ ශේෂයන්ට රු.2,562,402 ක් වූ ගෙවිය යුතු වෙළඳ ශේෂයන් ඇතුළත් කර තිබුණි. මුදල් කමිටුවේ හා පාලක සභාවේ අනුමැතිය සහිතව රු.861,137 ක ගෙවිය යුතු මුදල ආදායම් ගිණුමට මාරු කිරීමට පියවර ගත්

බවත් ඉතිරි රු.1,701,265 ක ශේෂය දැනට ක්‍රියාත්මක වන පාඨමාලා සඳහා යොදා ගන්නා බවත් මේ සම්බන්ධයෙන් උපකුලපතිවරයා දන්වා තිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට නොගෙවන ලද රු. 48,306 ක් වැටුප් ආදායමට බැර කිරීමෙන් තොරව වර්ෂ 01 සිට 02 දක්වා කාලයක් ගෙවිය යුතු මුදල් ලෙස පැවතුණි.

(ඈ) ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට (මධ්‍යම) , ලංකා විදුලිබල මණ්ඩලයට, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට සහ පොත් හා වාරසඟරා ආනයනය කිරීම වෙනුවෙන් සැපයුම්කරුවන්ට සහ වැටුප් අත්තිකාරම් ලෙස කාර්ය මණ්ඩලයට ආදී විවිධ පාර්ශවයන්ට ගෙවන ලද එකතුව රු.208,692,479 ක් වූ අත්තිකාරම්වලින් රු.163,555 ක මුදලක් වර්ෂ 10 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ විශ්ව විද්‍යාල සේවකයන් 52 කගෙන් නිවාස කුලී ලෙස අයකර ගත යුතු රු.41,250 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

(ඊ) නිලධාරින් 27 දෙනෙකුගෙන් අයකර ගත යුතු එකතුව රු.430,272 ක් වූ ණය වාරික සමාලෝචිත වර්ෂයේ එක් එක් මාසවල අදාළ නිලධාරින්ගේ වැටුප්වලින් අයකර ගෙන නොතිබුණි.

(උ) නිලධාරියෙකුගෙන් (වවුනියා මණ්ඩපය) අයවිය යුතු ආපදා ණය ශේෂය රු.53,055 ක්, යතුරු පැදි ණය ශේෂය රු.10,802 ක් හා පරිගණක ණය ශේෂය රු.18,000 ක් අයකර ගැනීමෙන් තොරව වර්ෂ 12 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ඌ) පොත් හා වාරසඟරා මිලදී ගැනීමේ හැකියාව පිළිබඳ විධිමත් ඇගයීමකින් තොරව 2013 දෙසැම්බර් 30 දින එකතුව රු.10,980,784 ක අත්තිකාරම් ගෙවා තිබුණි.එබැවින් ඇණවුම් කරන ලද විෂයයන් සැපයීමට සැලකිය යුතු කාලයක් ප්‍රමාද වී තිබුණි.

(එ) ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට (මධ්‍යම) ගෙවන ලද එකතුව රු.650,886 ක් වූ අත්තිකාරම් ශේෂය, විගණන පරීක්ෂණ දින වූ 2014 මැයි 31 වන විටත් විශ්වවිද්‍යාලයට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඒ) සිල්ලර බඩු හා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2006 වර්ෂයේදී නිලධාරියකුට ගෙවන ලද රු.1,121,194 ක් වූ නිරවුල් නොකළ අත්තිකාරම් සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

---------------------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම්වල ඇතුළත් එකතුව රු. 7,544,894,425 ක් වූ ඉන්වෙන්ට්‍රි විෂයයන් 7 ක පැවැත්ම තහවුරු කිරීම සඳහා වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පහත සඳහන් සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පරිත්‍යාග, කුලී ගෙවීම්, පාඩු හා හානි , අනතුරු, පීය මණ්ඩල විසින් ගනු ලැබූ තීරණ, ගෙවූ පර්යේෂණ දීමනා හා අධ්‍යයන වැඩ සටහන් ඵලදායීව පැවැත්වීම සම්බන්ධයෙන් තොරතුරුවල නිරවද්‍යභාවය විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

- විදේශ රටවල / තානාපති කාර්යාලවලින් ලැබුණු පරිත්‍යාග පිළිබඳ විස්තරාත්මක වාර්තා

- කුලියට ගන්නා ලද පරිශ්‍ර සඳහා තක්සේරු වාර්තා
- විශ්ව විද්‍යාල සනාථන සභාවේ සටහන්
- අනතුරු / පාඩු වාර්තා
- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයන් විසින් පවත්වන ලද අධ්‍යයන වැඩසටහන් විස්තර
- අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් නිම කරන ලද පර්යේෂණ පිළිබඳ විස්තර

**2.2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

රාජ්‍ය ව්‍යාපාර හා ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 1998 මාර්තු 06 දිනැති අංක පීඊ/01/174/119 ආ දරන ලිපිය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013 මැයි 23 දිනැති අංක 8/2013 දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය නිලධාරීන් සඳහා භාෂා ප්‍රවීණතාවය වෙනුවෙන් ගෙවන ලද දීමනා රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අදාළ නොවේ. කෙසේවුවද සමාලෝචිත වර්ෂය තුළ භාෂා ප්‍රවීණතා දීමනා ලෙස අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 57 දෙනෙකුට රු.397,807 ක මුදලක් ගෙවා තිබුණි.

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **(අ) පනත්** | |
| (i) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 109 වගන්තිය | 2012 වර්ෂය සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශන හා විගණකාධිපති වාර්තාව 2014 සැප්තැම්බර් 30 දක්වාත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. |
| (ii) 2008 ජනවාරි 01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද 3 වගන්තිය යටතේ නියෝග කරන ලද 2006 අංක 12 දරන මුද්දර බදු පනත (විශේෂ ප්‍රතිපාදන) | 2013 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා මාස සඳහා ගෙවීම් වවුචර් 40 ක් පිළිබඳ සිදුකරන ලද විගණන නියැදි පරීක්ෂණයේදී මුද්දර බදු අවශ්‍ය පරිදි අයකර දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබූ බව අනාවරණය විය. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය | |
| (i) XXII පරිච්ඡේදයේ II.I වගන්තිය | විමර්ශන කමිටුව පත්කිරීමෙන් මාසයක් ගතවීමෙන් පසුවත් රු.1,572,450 ක වංචනික ගෙවීම් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග පිළිබඳ කටයුතු ආරම්භ කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | XXVI පරිච්ඡේදයේ 2 ,3,4 වගන්ති | ප්‍රකාශන හා පොත් තොගය වාර්ෂිකව සමීක්ෂණය කර නොතිබුණි. |
| (iii) | XXVII පරිච්ඡේදයේ 3.1 වගන්තිය | විශ්වවිද්‍යාලයේ හා වවුනියා මණ්ඩපයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීම හා පිටවීම පැමිණීමේ ලේඛනයක සටහන් කර නොතිබුණි. |

(ඇ) මුදල් රෙගුලාසි

-----------------

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 135 (4) | ගිණුම් නිලධාරීන්ගේ වාර්ෂිකව කාර්යයන් බෙදාහැරීම පිළිබඳ සංශෝධිත විස්තර උපලේඛනයන් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 272 (1) | ගෙවීම් වවුචර් අදාළ වන මාසය අවසානයේ සිට සති 6 ක් ඇතුළත මාසිකව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 1645 | වාහන භාර නිලධාරියා විසින් එක් එක් වාහනයක් මඟින් සිදුකරන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශ හා සෑම මාසයක් සඳහා දෛනික ධාවන සටහන් වාර්තා අදාළ ආයතනයේ ප්‍රධානියා මඟින් ඊළඟ මාසයේ 15 වන දිනයට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එහෙත් 2014 ජූලි මාසය සඳහා පමණක් දෛනික ධාවන සටහන් වාර්තා විගණනයට ඉදිරිපත් කර තිබුණි. |

(ඈ) චක්‍රලේඛ විධිවිධාන

------------------------

| | | |
|---|---|---|
| (i) | 1980 පෙබරවාරි 25 දිනැති අංක 63 දරන විශ්ව විද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛය | අයවැයගත හා තථ්‍ය ආදායම සහ වියදම අතර විචලනය දැක්වෙන වාර්තාවක් හා එම විචලනයන් සඳහා හේතු සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහනවල ඉන්ධන පරිභෝජනය අවම වශයෙන් මාස 6 කට වරක් පරීක්ෂා කළ යුතුය. එසේ වුවද විශ්වවිද්‍යාලයට අයත් වාහන 12 ක් සම්බන්ධයෙන් එම පරිපාටිය සිදු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශ්ව විද්‍යාලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රු.1,037,920,000 ක රජයේ ප්‍රදාන සැලකිල්ලට ගැනීමට පෙර රු.1,157,048,668 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.869,160,000 ක රජයේ ප්‍රදාන සැලකිල්ලට ගැනීමට පෙර එම වර්ෂයේ ඌනතාවය රු.969,943,982 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.16,793,288 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. ඉකුත්

වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ගිවිසුම්ගත සේවාවල පුද්ගලික පඩිනඩි වැඩිවීම, ක්ෂය ගාස්තු හා ක්‍රමක්ෂය වියදම් සහ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලවල මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.1.1 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පවත්නා ඍජු දුරකථන මාර්ග භාවිතය අඩුකිරීම මඟින් නිල දුරකථන ගාස්තු අඩුකිරීම සඳහා 2011 වර්ෂයේදී විශ්ව විද්‍යාලයේ " ඉන්ටර්කොම් " පහසුකම් ස්ථාපනය කර තිබුණි. කෙසේ වුවද ඉන්ටර්කොම් මාර්ග මඟින් බාහිර දුරකථන ඇමතුම් පහසුකම් සමානව ලබා දී තිබූ හෙයින් සමාලෝචිත වර්ෂය සඳහා දුරකථන සන්නිවේදන ගාස්තු ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.4,697,076 කින් හෙවත් සියයට 32 කින් වැඩිවී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය සතුව අමුත්තන් සඳහා නිවසක් යාපනයේ තිබුණද, එම නිවෙස විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරි හා නියෝජ්‍ය ලේඛකාධිකාරි ( ප්‍රාග්ධන වැඩ ) විසින් 2009 වර්ෂයේ අප්‍රේල් සිට කිසිදු කුලී ගෙවීමකින් තොරව පදිංචියට ගෙන ඇති හෙයින් විශ්වවිද්‍යාලයට බාහිරින් පැමිණෙන නිලධාරීන්ට පුද්ගලික හෝටල්වල නවාතැන් පහසුකම් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලයට පැමිණි නිලධාරින් සඳහා නවාතැන් පහසුකම් වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් රු.825,125 ක මුදලක් ගෙවා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

සමාලෝචිත වර්ෂය තුළ විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්යසාධනය පහත පරිදි වේ.

#### (අ) විභාග ප්‍රතිඵල

-----------------

විශ්ව විද්‍යාලයේ එක් එක් පීඨයන් යටතේ පවත්වන විවිධ පාඨමාලා සඳහා විභාග පැවැත්වීමේ දිනයන් හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා ඉලක්ක දිනයන් තීරණය කර නොතිබුණි. 2012 හා 2013 වර්ෂයන් තුළ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම, කලා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ , විද්‍යා සහ බාහිර විභාග ඒකක පීඨයන්හි විභාග පැවැත්වීමේ දිනයේ සිට ප්‍රතිඵල නිකුත් කිරීමේ දිනය දක්වා මාස 01 සිට මාස 22 දක්වා සැලකිය යුතු කාල පරිච්ඡේදයක ප්‍රමාදයන් තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. 1995 ජුලි 14 දිනැති අංක 636 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව, විභාගයක් පැවැත්වීමෙන් අනතුරුව මාස 3 ක් ඇතුළත විභාගයේ ප්‍රතිඵල නිකුත් කළ යුතුය. එහෙත් ඉහත සඳහන් පරිදි සැලකිය යුතු කාලයකින් ප්‍රතිඵල ප්‍රමාද කර තිබූ හෙයින් නියමිත කාලය තුළදී රැකියා අවස්ථාවන් ලබා ගැනීමේ හැකියාව ශිෂ්‍යයින්ට අහිමි කර තිබුණි.

#### (ආ) ඒක ශිෂ්‍ය පිරිවැය

--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට විශ්ව විද්‍යාලයේ ලියාපදිංචි වී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 5,723 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා දරන ලද මුළු වියදම රු.815,147,732 ක් විය. එබැවින් පහත සඳහන් විස්තර පරිදි වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය සාමාන්‍ය පිරිවැය රු.142,434 ක් විය.

| | කලා | කෘෂිකර්මය | උපාධි අධ්‍යයන | වෛද්‍ය | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ | විද්‍යා | ව්‍යවහාරික විද්‍යා - වවුනියා මණ්ඩපය | ව්‍යාපාර අධ්‍යයන - වවුනියා මණ්ඩපය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| මුළු පිරිවැය (රු.) | 266,922,273 | 69,307,096 | 3,897,490 | 141,471,824 | 59,832,990 | 185,859,387 | 50,672,015 | 37,184,657 | 815,147,732 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 2,917 | 198 | 208 | 498 | 894 | 662 | 214 | 132 | 5,723 |
| ඒක ශිෂ්‍ය පිරිවැය(රු.) | 91,506 | 350,036 | 18,738 | 284,080 | 66,927 | 280,754 | 236,785 | 281,702 | 142,434 |

ඉහළම ඒක ශිෂ්‍ය පිරිවැය රු.350,036 ක් කෘෂිකර්ම පීඨයෙන් වාර්තා වී තිබූ අතර අඩුම ඒක ශිෂ්‍ය පිරිවැය රු.18,738 ක් උපාධි අධ්‍යයන පීඨය විසින් වාර්තා කර තිබුණි.

(ඇ) **මහපොළ හා ශිෂ්‍යාධාර**

සමාලෝචිත වර්ෂය තුළදී සිසුන් 1,950 කට හා සිසුන් 1,900 කට මහපොළ හා ශිෂ්‍යාධාර ලෙස පිළිවෙලින් රු.26,404,250 ක් හා රු.38,335,400 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද 2014 අගෝස්තු 11, විගණන දිනය දක්වා සිසුන් 580 දෙනෙකුට මහපොළ ලෙස රු.1,282,400 ක මුදලක් ගෙවා නොතිබුණි.

**(ඈ) පුස්තකාල පරිපාලනය**

(අ) පුස්තකාලයෙන් පොත් ලබා ගත් කථිකාචාර්යවරුන් 13 දෙනෙකු විසින් නියමිත කාලය තුළ පොත් 17 ක් ආපසු භාර දී නොතිබුණි. මේ සම්බන්ධයෙන් වර්ෂ 1 සිට වර්ෂ 28 දක්වා කාලයක් හිඟව පැවති මෙම පොත් ආපසු ලබා ගැනීමට හෝ ප්‍රමාදය සඳහා දඩ මුදලක් පැනවීමට කිසිදු විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලයට ලැබී නොතිබුණු රු.1,992,508 ක් වටිනා පොත්, සඟරා හා පුවත් සඟරා (journals) 724 ක් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය පියවර ගෙන නොතිබුණි.

### 4.1.1 බාහිර කථිකාචාර්යවරුන්

පත්වීම් ලිපිවල සඳහන් කර ඇති නිශ්චිත දේශන පැය බාහිර කථිකාචාර්යවරුන් විසින් ආවරණය කර නොතිබූ බැවින් විෂයයන්වල සම්පූර්ණ විෂය මාලාව බාහිර කථිකාචාර්යවරුන් විසින් ආවරණය කර නොතිබුණි.

### 4.1.2 පර්යේෂණ ප්‍රදාන හා පර්යේෂණ දීමනා ගෙවීම

සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ ප්‍රදාන හා පර්යේෂණ දීමනා පිළිවෙලින් රු.3,243,572 ක් හා රු. 52,799,328 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පර්යේෂණ ප්‍රදාන සඳහා ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ii) නිශ්චිත කාල පරිච්ඡේදය තුළ නිලධාරින් විසින් පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.
(iii) ප්‍රදාන ගෙවා තිබූ නිලධාරින්ට ප්‍රදාන උපයෝජනය සම්බන්ධයෙන් නියමයන් හා කොන්දේසි සහ නිර්නායකයන් ලබා දී නොතිබුණි.
(iv) වැඩ සැලැස්ම සහ උපලේඛණය පර්යේෂණ වාර්තා ඉදිරිපත් කිරීම සඳහා නිලධාරින් විසින් ලබා දී නොතිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යත්ව ලබා ගිය කථිකාචාර්යවරුන් 148 ක් ශිෂ්‍යත්ව සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු රාජකාරී සඳහා වාර්තා කර නොතිබුණි. කෙසේවුවද ගිවිසුම් කඩ කිරීම පිළිබඳව එම කථිකාචාර්යවරුන් 148 දෙනාගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු එකතුව රු.82,334,517 ක් අයකර ගැනීමට විශ්වවිද්‍යාලය අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. තවද මහාචාර්යවරයකු සඳහා කරන ලද සේවය අත්හිටුවීමෙන් පසුව එය ඉවත් කරගෙන සම්පූර්ණ වැටුප් සහිතව සේවයට වාර්තා කරන ලෙස ඉල්ලීමක් කර තිබුණි.

(ආ) උපකරණ මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ලෙස 2012 ඔක්තෝබර් 15 දින ලියා ආයතන 14 ක් වෙත නිකුත් කරන ලද රු.8,593,446 ක් වටිනා චෙක්පත් 22 ක් මාස 4 ක් ඉකුත්වීමෙන් පසුව අවලංගු කර තිබුණි. "තිබෙන අරමුදල් උපයෝජනය කිරීමේ අරමුණින් 2012 දෙසැම්බර් 30 දින චෙක්පත් ලියන ලද බවත්, ඇණවුම් කරන ලද අවස්ථාවේදී එම චෙක්පත් ලියා ඇති බවත් සැපයුම්කරු විසින් එම විෂයයන් නිශ්චිත කාලපරිච්ඡේදය තුළදී නොසපයන ලද හෙයින් අත්තිකාරම අවලංගු කිරීම සඳහා චෙක්පත් අවලංගු කරන ලද බවත්" මේ සම්බන්ධයෙන් උපකුලපතිවරයා දක්වා තිබුණි.

(ඇ) ඡායා පිටපත් යන්ත්‍ර 23 ක සේවා ගිවිසුම මත පුද්ගලික සමාගමකට රු.493,360 ක ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, ගිවිසුම්ගත කාලපරිච්ඡේදය තුළ සියලු ඡායා පිටපත් යන්ත්‍ර සඳහා මසකට එක් සේවාවක් බැගින් සමාලෝචිත වර්ෂය සඳහා සේවා 12 ක් සිදු කළ යුතුය. කෙසේ වුවද සේවා සැපයීම අවස්ථා 4 සිට 7 දක්වා පමණක් සිදු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.246,680 ක මුදලක් එම සමාගමට වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) පුද්ගලික සමාගමකට රු.3,150,000 ක පිරිවැයකට භාර දෙන ලද විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමේ සේවාව සඳහා 2013 නොවැම්බර් 18 දින කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.
කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, එම කාර්යය 2014 පෙබරවාරි 18 දින හෝ ඊට පෙර නිම කළ යුතුය. කෙසේ වුවද 2014 ඔක්තෝබර් 30 වන විට මාස 08 ක් ගතවීමෙන් පසුවත් කාර්යය නිම කර නොතිබුණි. විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2014 ජුනි දක්වා එම කාර්යයෙන් සියයට 25 ක් පමණක් නිම කර තිබුණි. තවද කාලය දීර්ඝ කරගැනීම සඳහා පූර්ව අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XXII පරිච්ඡේදයේ 11.1 වගන්තිය ප්‍රකාරව, විමර්ශන නිලධාරී විසින් මාස 03 ක කාලයක් ඇතුළත විමර්ශනයන් නිම කළ යුතුය. විනය ක්‍රියාමාර්ග හා සාවද්‍ය ක්‍රියා හේතුවෙන් වැඩ තහනම් කරන ලද නිලධාරීන්ට එරෙහිව විමර්ශනයන් පැවැත්වීම සඳහා විමර්ශන මණ්ඩල 4 ක් පත් කර තිබුණද, නියමිත කාලපරිච්ඡේදය තුළදී එම විමර්ශන මණ්ඩල විසින් එහි කාර්යයන් නිම කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය/ අධිකාරිය ලබා ගැනීමෙන් තොරව සම්පූර්ණ වැටුප එම වැඩ තහනම් කරන ලද නිලධාරීන්ට ගෙවා තිබුණි. තවද මහාචාර්යවරයෙකුට දෙන ලද වැඩ තහනම් පසුව ඉවත් කරගෙන තිබුණු අතර සම්පූර්ණ වැටුප් සහිතව ආපසු සේවයට වාර්තා කරන ලෙස ඉල්ලීමක්ද කර තිබුණි.

## 4.3 හඳුනාගන්නා ලද පාඩු

------------------------

2012 දෙසැම්බර් මාසයේ සිට 2013 මාර්තු දක්වා කාල පරිච්ඡේදය තුළ මිලදී ගන්නා ලද පොත් හා වාරසඟරා සඳහා ගෙවීම් වවුචර් 20 ක් මඟින් කරන ලද එකතුව රු.1,572,450 ක ගෙවීම, එම පොත්

ලැබීමෙන් තොරව කර තිබූ හෙයින් එය ව්‍යාජ ගෙවීමක් විය. මේ සම්බන්ධයෙන් අදාළ ගෙවීම වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. තවද ජර්නල් සටහනක් මඟින් මෙම ගෙවීම පොත් හා වාරසඟරා මත වූ පාඩු නම් වූ අවිනිශ්චිත ගිණුමට පාඩු සඳහා මාරු කර තිබූ අතර පාඩු අයකර ගැනීම සඳහා අභ්‍යන්තර හා බාහිර විමර්ශන ක්‍රියාවලියක් සිදු කරමින් පැවතුණි.

## 4.4 මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට විශ්ව විද්‍යාලයේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යා තත්ත්වය පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| අධ්‍යයන | 497 | 367 | 130 | - |
| අධ්‍යයන සහායක | 58 | 31 | 27 | - |
| තාවකාලික අධ්‍යයන | 140 | 183 | - | 43 |
| පරිපාලන | 686 | 561 | 125 | - |
| එකතුව | 1,381 | 1,142 | 282 | 43 |

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ ප්‍රමාදයන් සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 282 ක් පැවති අතර ඉන් 130 ක් විශ්ව විද්‍යාලයේ පීඨ 7 ක මහාචාර්යවරු ,සහකාර මහාචාර්යවරු ඇතුළත් ප්‍රධාන අධ්‍යයන තනතුරුවල පුරප්පාඩු විය. කෙසේවුවද මෙම පුරප්පාඩු පිරවීම සඳහා විශ්වවිද්‍යාලය විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 21 වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් පත්කරන ලද නිලධාරීන් 1,142 ක ගේ අධ්‍යාපන සුදුසුකම් සම්බන්ධයෙන් සෘජු සනාථ කිරීම් අදාළ ආයතනවලින් ලබා ගෙන නොතිබුණි.

(ඈ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 20:16 ඡේදයේ විධිවිධාන හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් ඉදිරිපත් කරන ලද 2012 සැප්තැම්බර් 28 දිනැති අංක යූජීසී/එච්ආර්/3/1/6 දරන ලිපියේ සඳහන් විධිවිධාන සැලකීමෙන් තොරව විවිධ පාර්ශවයන්ගේ අභියාචනා සැලකීම මඟින් සානුකම්පිතව සලකා සේවය නතර කරන ලද සේවකයන් නැවත සේවයේ පිහිටුවීමට විශ්ව විද්‍යාල පාලක සභාව තීරණය කර තිබුණි.

## 4.5 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) වැඩ ඉංජිනේරු විසින් විධිමත් අනුමැතියක් නොමැතිව ප්‍රමාණ බිල් පත්‍ර (BOQ) වැඩි කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය මධ්‍යස්ථානයේ සිදුකරන ලද වැඩ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.115,087 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ගිවිසුමේ එකඟ වූ පරිදි කොන්ත්‍රාත්කරු විසින් ජලනළ අලුත්වැඩියා හා අභ්‍යන්තර විදුලි අලුත්වැඩියා සිදුකර නොතිබුණි.

(ඇ) ගරාජය ඉදිකිරීමට අදාළව අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කොන්ත්‍රාත්කරු විසින් රු.228,374 ක වටිනාකමට වැඩ පිළිබඳ අතිරේක උපලේඛනගත රේටයන් හා ලැබිය යුතු උපලේඛනගත රේටයන් (ESR & ISR) ක්‍රියාත්මක කර තිබුණි.

## 4.6 මතභේදයට තුඩුදෙන කරුණු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) එල්.එල්.බී.(L.L.B) ශිෂ්‍යයින් සඳහා 4 වන වසර අධ්‍යයන වැඩසටහන කොළඹ කුලියට ගත් ගොඩනැගිල්ලක පැවැත්වීමට විශ්ව විද්‍යාලයේ සනාථන සභාව තීරණය කර තිබුණි. ගොඩනැගිලි, සම්පත් දායකයන්, හා වෙනත් සියලු පහසුකම් විශ්ව විද්‍යාලයේ ලබා ගැනීමට තිබූ නමුත්, මසකට රු.100,000 බැගින් වූ කුලියක් මත කොළඹින් ලබාගත් ගොඩනැගිල්ලක දේශන පවත්වා තිබූ අතර 2013 දෙසැම්බර් 31 දක්වා කුලී ලෙස රු.6,630,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ii) අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පැමිණීමේ ලේඛනය දීර්ඝ කාලයක සිට පවත්වා නොතිබුණි. එබැවින් ලබා ගත් නිවාඩු හා සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය මණ්ඩලයට ගෙවන ලද රු.697,024,683 ක් වූ වැටුප්වල නිරවද්‍යතාවය විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(iii) 2011 වර්ෂයේදී ඇඟිලි සලකුණු මුද්‍රණ ස්කැනර් යන්ත්‍ර ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණද, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2010 පෙබරවාරි 15 දිනැති අංක 02/2010 දරන ආයතන චක්‍රලේඛය ප්‍රකාරව අරමුණු කළ කාර්යයන් සඳහා එය ඵලදායීව ස්ථාපිත කර නොතිබුණි.

## 4.7 අවිධිමත් ගනුදෙනු

එකතුකළ අගය මත බදු ලියාපදිංචි අංකවල වලංගුභාවය හා ගෙවීම් කරන අවස්ථාවේදී එකතුකළ අගය මත බදු ඉන්වොයිසි පරීක්ෂා කිරීමෙන් තොරව ඉංජිනේරු පීඨයේ සිදුකරන ලද සිවිල් වැඩ සඳහා විශ්වවිද්‍යාලය විසින් එකතුව රු.424,175 ක එකතුකළ අගය මත බදු (VAT) ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරුවන් විසින් සඳහන් කරන ලද එකතුකළ අගය මත බදු අංක අක්‍රීය අංක බව පසුව නිරීක්ෂණය වී තිබුණි.

## 4.8 ප්‍රසම්පාදන පරිපාටියේ දුර්වලතා

සමාලෝචිත වර්ෂය තුළ කාර්යාල ලී බඩු හා උපකරණ, පොත් හා වාරසඟරා, උපාධි ලෝගු, දුරකථන හුවමාරු පද්ධති හා ලිපිද්‍රව්‍ය ප්‍රසම්පාදනය සඳහා රු.328,703,735 ක මුදලක් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ අංක 07 සිට අංක 13 දක්වා සඳහන් කරන ලද විෂයයන් සඳහා නිම කිරීමේ ඉලක්ක දිනයන් දක්වා නොතිබුණි.

(ආ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.2 අනුව, කාලක්‍රමානුගත ක්‍රමයකට හා එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භයේ සිට එහි නිමකිරීම දක්වා විස්තර කරමින් ප්‍රසම්පාදන කාල සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේවුවද කාල සැලැස්ම හා එක් එක් ප්‍රසම්පාදන කාර්යයේ පියවරයන් විශ්වවිද්‍යාලය විසින් පිළියෙල කර නොතිබුණි.

## 4.9 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) එකතුව රු.1,599,197 ක් වූ සැපයුම් සහ යතුරුලියන කඩදාසි, විදුලි භාණ්ඩ, විදුලි පංකා ආදි නඩත්තු විෂයයන් විශ්ව විද්‍යාල ගබඩාවල වර්ෂ 1 සිට වර්ෂ 15 දක්වා කාල පරිච්ඡේදයක් නිෂ්කාර්යව පැවැතුණි. මේ සම්බන්ධයෙන් ඒවා උපයෝජනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගන්නා ලද වැහි කබා 69 කින් වැහි කබා 65 ක් සේවකයින් විසින් ලබා ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව වැහි කබා ගබඩාවල නිෂ්කාර්යව පැවතුණි.

## 4.10 වාහන සංචිතය කළමනාකරණය

------------------------------------

(අ) වාහන ධාවන සටහන් පැවැත්වීම

----------------------------------------

- ඉන්ධන ඇණවුම් අංක, ඉන්ධන බිල්පත්වල දින හා අංක වාහන ධාවන සටහන්වල ඇතුළත් කර නොතිබුණි.
- ධාවන සටහන්වලට අනුව, විශ්ව විද්‍යාලයේ වවුනියා මණ්ඩපය විසින් භාවිතා කරන ලද වාහන 4 කට අදාළව රු.96,504 ක වැඩිපුර ගෙවීමක් කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.
- වාහන ධාවන සටහන්වල ගමනේ අරමුණ සඳහන් කර නොතිබුණි.

(ආ) කුළී වාහන

-----------------

සමාලෝචිත වර්ෂය තුළ වාහන කුලී ගාස්තු ලෙස රු.2,509,795 ක මුදලක් ගෙවා තිබුණි. විශ්ව විද්‍යාලයේ වාහන සංචිතයේ වාහන 12 ක් තිබුණද, විශ්වවිද්‍යාලය විසින් වාහන කිහිපයක් කුලියට ලබා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වාහන කුලියට ගැනීම සඳහා ප්‍රසම්පාදන පරිපාටිය විධිමත්ව අනුගමනය කර නොතිබුණි.
- දිස්ත්‍රික් ලේකම් විසින් නියම කරන ලද ආර්ථික / රජයේ රේටය සැලකීමෙන් තොරව කිලෝමීටරයකට රේටය ගෙවා තිබුණි.
- ප්‍රවාහන සේවා ලබා ගැනීම සඳහා ලියාපදිංචි ප්‍රවාහන නියෝජිතායතනවලින් මිල කැඳවීම් කර නොතිබුණි.
- කුලියට ගත් වාහන පාවිච්චි කරන ලද නිලධාරින් විසින් මයිලෝ මීටරය කියවීම හා ගමනට ගතකළ කාලය සහතික කර නොතිබුණි.

- වාහන වෙන් කිරීම සඳහා ලේඛනයක් පවත්වා නොතිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**5.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව, 2011 හා 2012 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා 2014 සැප්තැම්බර් 30 දක්වාත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන චක්‍රලේඛ ලිපිය අනුව , සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික කාර්යසාධන වාර්තාව විශ්වවිද්‍යාලය විසින් පිළියෙල කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව පහත සඳහන් ගනුදෙනු ක්ෂේත්‍ර අභ්‍යන්තර විගණන ඒකකය විසින් සම්පූර්ණයෙන් පරීක්ෂා කර / ආවරණය කර නොතිබුණි.

(අ) ප්‍රාග්ධන ව්‍යාපෘති හා කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ පසු විගණනය

කෙරෙමින් පවතින කොන්ත්‍රාත් වැඩ නිම නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන ව්‍යාපෘති හා කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ පසු විගණනය සම්පූර්ණයෙන් ආවරණය කිරීමට නොහැකි වූ බවත් කොන්ත්‍රාත් කළමනාකරණයේ අර්ධයක් අභ්‍යන්තර විගණනය මඟින් ආවරණය කළ බවත් ඉතිරි වැඩ වරින් වර විගණනය කරන බවත් මේ සම්බන්ධයෙන් උපකුලපතිවරයා සඳහන් කර තිබුණි.

(ආ) විශ්ව විද්‍යාලයේ ප්‍රසම්පාදනයන්

භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයට අදාළ ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම මඟින් අභ්‍යන්තර විගණනය විසින් ප්‍රසම්පාදන වැඩ විගණනය කළ බවත් අනාගතයේදී ඒවා සම්පූර්ණයෙන්ම පරීක්ෂා කිරීමට කටයුතු කරන බවත් මේ සම්බන්ධයෙන් උපකුලපතිවරයා සඳහන් කර තිබුණි.

**5.4 පිළිතුරු නොලත් විගණන විමසුම්**

2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා නිකුත් කරන ලද විගණන විමසුම් 09 කට පිළිතුරු සැපයීම සඳහා විශ්වවිද්‍යාලය පියවර ගෙන නොතිබුණි. විස්තර පහත පරිදි වේ.

| වර්ෂය | පිළිතුරු නොලත් විගණන විමසුම් සංඛ්‍යාව |
|---|---|
| 2011 | 01 |
| 2012 | 01 |
| 2013 | 07 |
| | 09 |

**5.5** **අයවැය පාලනය**

**-------------------**

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6.** **පද්ධති හා පාලන**

**-----------------------**

පද්ධති හා පාලන පිළිබඳ නිරීක්ෂණය වූ අඩුපාඩු උපකුලපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) පුස්තකාල පරිපාලනය
(ඇ) ගබඩා පරිපාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල්
(ඊ) ප්‍රසම්පාදනයන්
(උ) මානව සම්පත් කළමනාකරණය
(ඌ) අයවැය